**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල**

**10 ශ්‍රේණිය හූගෝල විද්‍යාව නොවැම්බර් 2 සතිය**

**නිපුණතාව ඃ-** දත්ත හා තොරතුරු රැස් කිරීම විශ්ලේෂණය කිරීම, අර්ථ නිරූපනය හා ඉදිරිපත් කිරීම සඳහා භූගෝල විද්‍යාවේ ක්‍රම ශිල්ප භාවිත කරයි.

**නිපුණතා මට්ටම ඃ-** විවිධ සිතියම් වර්ග හඳුන්වා ශ්‍රී ලංකා 1ඃ50000 භූ ලක්ෂණ සිතියම්වල පර්යන්ත තොරතුරු නිරූපණය කරයි.

**මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් පල ඃ-**

* තේමා සිතියම් සහ 1ඃ50000 භූ ලක්ෂණ සිතියම් අතර වෙනස පැහැදිලි කරයි.

* ශ්‍රී ලංකාවේ 1ඃ50000 භූ ලක්ෂණ සිතියම කොටස් 92කට බෙදීම සඳහා පදනම් කරගත් ක්‍රමවේදය පැහැදිලි කරයි.

* ශ්‍රී ලංකා 1ඃ50000 සිතියමේ මූලික ලක්ෂණ නම් කරයි.

* ශ්‍රී ලංකා 1ඃ50000 සිතියම්වල දැක්වෙන පර්යන්ත තොරතුරු නිරූපණය කර අර්ථ දක්වයි.

* ශ්‍රී ලංකා 1ඃ50000 භූ ලක්ෂණ සිතියම්වල දැක්වෙන භෞතික හා සංස්කෘතික ලක්ෂණ අතර ඇති අන්තර් සම්බන්ධතාව පැහැදිලි කරයි.

**පාඩම ඃ-** සිතියම් හැඳින්වීම- සිතියමක දිශාව දැක්වීම පරිමාණය හා දුර ගණනය කිරීම

**ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් ඃ-**

10 ශ්‍රේණිය භූගෝල විද්‍යාව පෙළ පොතෙහි පිටු අංක 149 සිට 151 තෙක් හොඳින් කියවන්න. පහත දක්වා ඇති උපයෝගී කරගත හැකි පොත්පත් හා ඉගෙනුම් ආධාරකද පරිශීලනය කර වැඩිදුර අධ්‍යයනය කරන්න.

- ❖ සාමාන්‍යයෙන් සිතියමක ඊතලයක් මගින් උතුරු දිශාව දක්වා තිබේ.
- ❖ එමගින් ප්‍රධාන දිශා හා අනු දිශා හඳුනාගෙන සිතියමෙහි අන්තර්ගත තොරතුරු නිවැරදිව තේරුම් ගැනීමේ හැකියාව ඇත.
- ❖ 1ඃ50000 සිතියමක දිශාව දැක්වීමේ සටහන, පර්යන්ත තොරතුරු දක්වන වට තීරුවේ පහළ කොටසෙහි සැබෑ උතුර, චුම්භක උතුර හා ජාල උතුර ලෙස විශේෂ සටහනක් ලෙස දක්වා ඇත.
- ❖ සිතියමෙහි කිසියම් ස්ථාන දෙකක් අතර දුර හා භූමියේ එම ස්ථාන දෙක අතර ඇති සැබෑ දුර අතර අනුපාතය පරිමාණය යි.
- ❖ 1ඃ 50000 භූ ලක්ෂණ සිතියම්හි පරිමාණය රේඛීය පරිමාණය හා නියෝජ්‍ය පරිමාණය ලෙස ක්‍රම දෙකකට දක්වා ඇත.
- ❖ සිතියමෙහි 2cm කින් භූමියේ 1 km දුරක් පෙන්නුම් කෙරේ.

**ක්‍රියාකාරකම**

01. 1෴ 50000 සිතියමක දිශාව දක්වන ක්‍රම 3 නම් කර රූප සටහනක් අඳින්න.

02. සිතියමක පරිමාණය දක්වන ක්‍රම දෙක දක්වන්න.

03. රේඛීය පරිමාණය නිරූපිත සටහනක් අඳින්න.

04. රේඛීය පරිමාණය දක්වන සටහනේ මුල කොටස අනු කොටස්වලට බෙදා දැක්වීමට හේතු මොනවාද?

05. සිතියමෙහි 12 cm ක් විහිදෙන මාර්ගයක සැබෑ දුර සොයන්න.

06. සිතියමෙහි 20 cm ක් විහිදෙන මාර්ගයක සැබෑ දුර සොයන්න.

07. 3 km ක් දිග මාර්ගයක් 1෴ 50000 සිතියමේ දැක්වෙන්නේ සෙන්ටි මීටර් කීයකින්ද.

08. 7 km ක් දිග මාර්ගයක් 1෴ 50000 පරිමාණයට සිතියම්ගත කිරීමේ දී සිතියමේ දැක්විය යුතු දුර සොයන්න.

**ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගත හැකි පොත්පත් හා ඉගෙනුම් ආධාරක ෴-**


- නවීන ගුණසේන - ෆිලිප්ස් ලෝක සිතියම් පොත (2003), සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.
- ප්‍රායෝගික භූගෝල විද්‍යාව, අ. පො. ස උසස් පෙළ (2009), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.
- e නැණ පියස - (enenapiyasa.lk)
- හොරණ කලාප අධ්‍යාපන කාර්යාලය - සවියනේ පෙරට යූ ටියුබ් නාලිකාව https://www.saviyenperata.com/